සැ. යු.- 2011.02.11 වැනි දින පළ වූ අංක 1,693 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,694 - 2011 පෙබරවාරි මස 18 වැනි සිකුරාදා - 2011.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණයේ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 58 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලු ම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 පෙබරවාරි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 පෙබරවාරි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

වික්ටර් ඇන්තනි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "ද. මු. දසනායක සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි" යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තවන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(1) ශ්‍රී ලාංකික ජනතාවගේ දිළිඳුබව පිටුදැකීම උදෙසා අවශ්‍ය සංවර්ධනය තුළින් ජනතාව පෝෂණය කිරීම.

(2) මානව වර්ගයා මුහුණ දෙන මානසික හා චිත්තවේග පීඩාවන්ට සහනදායී ඉගැන්වීම ප්‍රගුණ කිරීමෙන් ඔවුන් තුළ පවතින අසහනකාරී තත්වය අවමකොට සහනශීලී දිවි පෙවෙතකට යොමු කරවීම.

(3) ජාති ආගම් බේදවලින් තොරවූ සදාචාරාත්මක සමාජයකට ඉවහල් වන සමාජ පෞරුෂත්වය හඳුනාගෙන පවුල හා සමාජය ස්වයංපෝෂිත ඒකකයක් බවට පත්කිරීම.

යනාදිය වේ.

වික්ටර් ඇන්තනී,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

පුත්තලම දිස්ත්‍රික්කය.

02-345

## ජයන්තිපුර සුහසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ශ්‍රියානි විජේවික්‍රම වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝග යටතේ "ජයන්තිපුර සුහසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි," යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්තවන්නා ඉහත කී සංගමය සංස්ථාගත කිරීමයි :-

(1) ජයන්තිපුර පදිංචිකරුවන්ගේ සංයුතියෙහි බහුවිධතාව හඳුනා ගනිමින්, සාමාජිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ අන්‍යෝන්‍ය සුහසාධනය පිණිස පෙළඹවීම, පෝෂණය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(2) සමාජිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම්, ස්වාධීනතා හා වරප්‍රසාද, ආරක්ෂා කිරීම හා රැක ගැනීම.

(3) මූලික වශයෙන් සාමාජිකයන්ගේ හා කලාපයේ පාසල හැරගිය හා උගත් රැකියා විරහිත තරුණ පිරිසේ සුහසිද්ධිය පිණිස වෘත්තිය පුහුණු යෝජනා ක්‍රම සංවිධානය කිරීම සහ ඒ සඳහා ඔවුන් උනන්දු කරවීම.

යනාදිය වේ.

ශ්‍රියානි විජේවික්‍රම,
පාර්ලිමේන්තු මන්ත්‍රිනි,
දිගාමඩුල්ල දිස්ත්‍රික්කය.

02-508

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.